ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006/2007

සාධාරණත්වයේ මූලධර්ම - **LWU 1202**

කාලය - පැය තුනයි.

---

දිනය -2007.03.07 වේලාව - පෙ.ව.10.00 -ප.ව.01.00 දක්වා

---

*ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.*
*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

## *1 වෙනි කොටස - සාධාරණත්වයේ මූලධර්ම.*

මෙම කොටසින් *එක් ප්‍රශ්නයකට* පමණක් පිළිතුරු සපයන්න.

01. ඉංග්‍රීසි නීතියේ සාධාරණත්ව සංකල්පය වර්ධනයවීම ඇසුරින් පහත දැක්වෙන ආප්ත විවේචනාත්මකව පහදන්න.

(අ) සාධාරණත්වය යම් පුද්ගලයකුට විරුද්ධව පමණක් ක්‍රියාත්මක වේ.

(ආ) සාධාරණත්වය මගින් සෑම හානියක් සඳහාම පිළියමක් සැපයෙයි.

02. "සාධාරණත්වය මූලික වශයෙන් පොදු නීතිය සඳහා වූ ඔපයක් හෝ උපාංගයක් වූයේය."

ඉංග්‍රීසි නීතියේ සාධාරණත්වය යන්න බිහිවීම, වර්ධනය පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න.

## *2 වෙනි කොටස - භාර නීතිය*

මෙම කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

**03.** දිල්ෂාන් සම්භාණ්ඩ කර්මාන්ත ශාලාවක් අරුන්ට සහ සෙල්වන්ට පවරනු ලබන්නේ එය විකුණා ලැබෙන ප්‍රතිලාභය දිනේෂ්ගේ අර්ථලාභය පිණිස ආයෝජනය කිරීමටයි. ඒ අනුව අරුන් සහ සෙල්වන් එම කර්මාන්ත ශාලාව විකුණා එම මුදල අරුන් ලබාගත් අතර ඒවා අරුන් තමන් ළඟ මාස හයක් තබා ගත්තේය. එම මුදලින් අරුන් තමා නමින් නිවසක් මිලදී ගත්තේය.

භාර ආඥාපනත යටතේ තම අයිතිවාසිකම් පිළිබඳවත්, අරුන් සහ සෙල්වන්ගේ වගකීම් පිළිබඳවත් දිනේශ් ඔබගෙන් උපදෙස් පතයි.

දිනේශ්ට උපදෙස් දෙන්න.

04. ප්‍රමුඛපෙළේ ව්‍යාපාරිකයකු වන ආනන්දන් අන්තිම කැමති පත්‍රයක් මගින් පහත පැවරීම් සිදු කරයි. ඒවා මගින් වලංගු පුන්‍යභාර ඇතිවන්නේදැයි සාකච්ඡා කරන්න.

අ. මධ්‍යම පළාතේ භාවනා පන්ති පැවැත්වීම සඳහා රුපියල් මිලියන දෙකක් සායි පදනමට.

ආ. තම සමාගමේ පුස්තකාලයට පොත් ගැනීම සඳහා රුපියල් මිලියනයක් මරුති සිමෙන්ති සමාගමට.

ඇ. තම සංගමයේ සාමාජිකයන් වෙනුවෙන් කම්කරු අයිතීන් පිළිබඳ වැඩමුළු පැවැත්වීම සඳහා රු.500,000/- ලංකා කම්කරු සංගමයට.

ඈ. උපාධි අපේක්ෂක දිළිඳු සිසුන්ට ශිෂ්‍යත්ව දීම සඳහා රුපියල් මිලියන 10 ක් අන්තර් විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂක සංගමයට.

05. අ. විනිශ්චිත නඩුතීරණ ඇසුරින් භාර ආඥාපනතේ 90 වන වගන්තියේ විෂය පථය පිළිබඳ විවේචනාත්මකව පහදන්න.

ආ. අමලා , රවි සහ බිමලා **"A සහ B"** හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් ය. හවුල් ව්‍යාපාරයේ අරමුදලින් තම නමට ඉඩමක් මිලදී ගන්නා අමලා එහි නිවසක් ඉදි කරයි.

භාර ආඥා පනතේ ප්‍රතිපාදන/ප්‍රතිපාදනයන් යටතේ අමලාට එරෙහිව රවි සහ බිමලා නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් කරයි.

ඔවුනට උපදෙස් දෙන්න.

06. නීතිඥවරියක වන මයුමි මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරිනියකි. මානව හිමිකම් සංවිධානයක නීති උපදේශකවරියක ලෙස ඇය 1997 වසරේ සිට කටයුතු කරයි. ඇයගේ සේවය අගයනුවස් එම සංවිධානය මගින් විදේශ විශ්වවිද්‍යාලයක ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා ඇයට ශිෂ්‍යත්වයක් ප්‍රදානය කරන ලදී. රත්නපුරේ වත්තක් සහ කොළඹ 7 හි නිවසක් ද මයුමිට ඇත්තේය. ඇය තම පෙම්වතා වන ෆාරුක්ට මෙම දේපල පවරන්නේ ඇය ශ්‍රී ලංකාවට ආපසු පැමිණිවිට නැවත පවරනු ලැබේය යන අවබෝධයෙනි. ෆාරුක් මයුමිගේ මිතුරියක වන සත්‍යා විවාහ කර ගනී. ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු තම දේපල ආපසු පවරන ලෙස ෆාරුක්ගෙන් මයුමි ඉල්ලා සිටියාය. නමුත් නැවත දේපල පැවරීමට ෆාරුක් ප්‍රතික්ෂේප කරයි.

මයුමි ඔබගේ උපදෙස් පතයි. ඇයට උපදෙස් දෙන්න.

07. (අ) වලංගු ප්‍රකාශිත භාරයක් නිර්මාණය කිරීම සඳහා කුමන අවශ්‍යතාවන් සපුරාලියයුතු ද යන්න පිළිබඳව විස්තර කරන්න.

(ආ) ශිල්පාගේ අන්තිම කැමති පත්‍රයෙන් කරන ලද පහත පැවරීම් වලින් වලංගු භාර නිර්මාණය වන්නේ ද යන්න සාකච්ඡා කරන්න.

(i) කළුබෝවිල ජාත්‍යන්තර පාසැලේ ඉගෙනුම ලබන මගේ මුණුපුරාට පොත් මිලදී ගැනීම සඳහා මගේ ඉතිරිකිරීමේ ගිණුමෙන් රු.300,000/- ක් සුරේෂ්ට සහ ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂය මගේ මිතුරන්ට පාපැදි මිලදී ගැනීම සඳහා සුරේෂ්ට.

(ii) මගේ මුණුපුරු මිණිපිරියන්ගේ භාවිතය සඳහා පරිගණක මිලදී ගැනීමට රු.700,000/- ක් මගේ සහෝදර රමේෂ්ට.

08. පහත සඳහන් ඒවා පිළිබඳ සටහන් ලියන්න.

අ) භාර ආඥාපනතේ දෙවන වගන්තිය.

ආ) භාර ආඥාපනත යටතේ භාරකරුවන්ගේ නොහැකියාවන්.

- හිමිකම ඇවිරිණි. -